# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2229/5 - 2021 මැයි මස 25 වැනි අඟහරුවාදා - 2021.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

4 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාපිත සමාගම් ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය වෙළෙඳාම් සිදු කිරීමේදී යටත් විය යුතු, මේ යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, කාර්යයන්, නියම සහ කොන්දේසි නියම කරනු ලැබේ.

2. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාපනය කරන ලද සමාගම්වලට (මෙහි මින්මතු "මවු සමාගම" වශයෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ව අවසරය සහිතව, විදේශ විනිමය උපයන්නන් වන ශ්‍රී ලංකාවෙහි සංස්ථාපනය කරන ලද ඔවුන්ගේ පාලිත සමාගම් වෙත ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ණය දීම සඳහා, පහත කරුණුවලට යටත්ව, මෙමගින් අවසර දෙනු ලැබේ.

i. 2021 පෙබරවාරි මස 3 දිනැති අංක 2213/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය නියෝග (මෙහි මින්මතු "2021 අංක 2 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) සහ මෙම නියමය යටතේ දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, මවු සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබාගත් ණය මුදලකින් (මෙහි මින්මතු "විදේශ ණය" වශයෙන් හඳුන්වනු ලබන) පමණක් පාලිත සමාගම වෙත එකී විදේශ ව්‍යවහාර මුදල් ණය (මෙහි මින්මතු "විදේශ ව්‍යවහාර මුදල් ණය" වශයෙන් හඳුන්වනු ලබන) ප්‍රදානය කළ යුතු ය.

ii. ඉහත අවසරය යටතේ ප්‍රදානය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ණය නැවත ගෙවීම් වශයෙන් පාලිත සමාගම්වලින් ලැබුණු විදේශ විනිමය ඇතුළු ව මවු සමාගමෙහි විදේශ විනිමය ඉපැයීම්වලින් එකී විදේශ ණයට අදාළ නැවත ගෙවීම් එම සමාගම විසින් සිදුකළ යුතුය. එකී නැවත ගෙවීම්, රුපියල් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීම මගින් සිදු කිරීමට අවසර ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට යටත්ව අවසාන පිළියමක් වශයෙන් පමණි.


1A - PG 5450 — 500 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

iii. පාලිත සමාගම විසින් මවු සමාගමෙන් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් ණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද අවසරයට අනුව පාලිත සමාගම විසින් බලයලත් වෙළෙන්දෙකු සමග විවෘත කරන ලද විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කළ යුතු අතර, එකී ණය මුදලට අදාළ සියලුම නැවත ගෙවීම් (මුල් මුදල සහ පොලිය) එම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහාම සිදුකළ යුතු ය.

iv. පාලිත සමාගමට අනාගත විදේශ විනිමය ඉපැයීම් තිබිය යුතු අතර මවු සමාගමෙන් ලබාගන්නා ලද එකී විදේශ ව්‍යවහාර මුදල් ණයට අදාළ සියලුම නැවත ගෙවීම් පාලිත සමාගමෙහි විදේශ විනිමය ඉපැයීම්වලින් පමණක් සිදු කළ යුතු ය.

v. පාලිත සමාගම විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ණය එහි ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු (ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු හැර) සඳහා පමණක් යොදාගත යුතු ය.

vi. කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ, පාලිත සමාගමට, රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම මගින් එකී විදේශ ව්‍යවහාර මුදල් ණයට අදාළ නැවත ගෙවීම් (මුල් මුදල සහ පොලිය) සිදුකළ නොහැකි ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

06 - 228

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.